**ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1, 1.6.2 හා 1.6.3 ඡේදයන් හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බඩු ලේඛන පොත | | |
| බඩු ලේඛන පොත විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | බඩු ලේඛන පොත්පත් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනිමින් සිටි. |

### 1.6.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික විම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොතිබුණි. |

යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්, චෙක්පත් හා වත්කම් භාරව කටයුතු කරන සේවකයන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැන්පත් කළ යුතු වුවත් එසේ ඇප තැන්පත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටුයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | 2019 නොවැම්බර් 11 දිනැති අංක 05/2019 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය. | 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ලේකම් විසින් ගිණුම් පියවීමට අදාලව වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකුට එම නිලධාරියාගේ නමින්ම බලය පැවරිය යුතු බව හා ඊට අදාල පිටපත් විගණකාධිපති වෙත යැවිය යුතු බව දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුව බදු කුලී හා පළාත් පාලන ආයතන බදු සඳහා වූ රු.4,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.3,999,000 ක් වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වෙනත් වැය ශීර්ෂයකට මාරු කිරීමට සිදු විය. |
| (ආ) | අවශ්‍යතාවයකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 10 ක ප්‍රතිපාදනවලින් රු.29,965,778 ක් ඉතිරිව තිබූ අතර එම ඉතිරිවීම සියයට 15 සිට සියයට 100 දක්වා වූ පරාසයක් තුල විය. | අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතු විය. |
| (ඇ) | ඇස්තමේන්තු සැකසීමේදී ප්‍රමුඛතා හඳුනාගැනීමකින් තොරව ප්‍රතිපාදන වෙන් කර ගැනීම හා සමාලෝචිත වර් ෂය තුලදී සැලසුම්ගත කාර් යයන් එපරිදි ඉටුකිරීමට නොහැකි වීම යන කරුණු හේතුවෙන් මූලධන වැය විෂයයන් 51 ක රු.15,186,816,547 ක් වූ ප්‍රතිපාදන සියයට 15 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක ඉතිරි වී තිබුණි. | -එම- | ව්‍යාපෘති කරගෙන යාමේදී ඇති වූ වෙනත් ප්‍රායෝගික ගැටළු හේතුවිය. |
| (ඈ) | මුළු විදේශ ණය ප්‍රතිපාදනය රු.මිලියන 11,960,000 ක් වූ අතර ඉන් සියයට 57 ක් එනම් රු.6,860,490 ක් උපයෝජනය කර නොතිබුණි. | -එම- | ප්‍රසම්පාදන කටයුතු වල නොවිසඳුණු හා ගැටළුකාරී තත්ත්වයන් මේ සඳහා හේතු වී ඇති බව. |
| (ඉ) | අමාත්‍යාංශය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනය රු.41,676,388,000 ක් වුවද ඉන් සියයට 38 ක් එනම් රු.15,961,865,587 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | -එම- | පිළිතුරු ලබාදී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහන් අංක 02 යටතේ වූ ප්‍රාග්ධන වැය විෂයයන් 02 කට අතිරේක ප්‍රතිපාදන සලසා තිබූ අතර, එම ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වූ අවසන් ගෙවීම් බිල්පත් මුදල හා ව්‍යාපෘතිවල බැරකම්වල මුදල වශයෙන් එකතුව රු. 346,500,000 ක් මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි. | අදාළ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වීම. | -එම- |
| (ඌ) | අංක 7002/0000/00/0323/0017/000 දරන ගිණුමට අදාලව රු. 1,418,652 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතුණි. | නොපියවූ අත්තිකාරම් පිළිබඳ සොයා බලා පියවීමට කටයුතු කළ යුතුය. | අත්තාකාරම් අයකර ගැනීම සඳහා මේ වන විට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය දැව සංස්ථාවට ගෙවිය යුතු රු.1,731,821 ක් බැරකම් ලෙස දක්වා නොතිබුණි. | බැරකම් නිසි ලෙස හඳුනාගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බැංකු ගිණුම් දෙකකට අදාල තොරතුරු විසර්ජන ගිණුම් සටහන් තත්ත්ව වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල තත්ත්ව වාර්තාවේ අදාළ වටිනාකම් ඇතුළත් කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වී නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහජනතාවගේ සහ ආර්ථිකයේ යහපැවැත්ම පිණිස ස්වාභාවික පරිසරය තිරසාර කිරීමෙන් සෞඛ්‍යමය හා ප්‍රසන්න පරිසරයක් යන දැක්ම සහිතව ක්‍රියාත්මක වන පරිසර අමාත්‍යාංශය සියළු පාර්ශවයන්ගේ දායකත්වය සහිතව අපද්‍රව්‍ය කළමනාකරණ සිදු කළ යුතුය. ඒ සඳහා මනා යාන්ත්‍රණයක් ගොඩ නැංවීමේ අවශ්‍යතාවය මේ වන විට උද්ගත වී ඇති අතර මෙසේ පාරිසරික ගැටළු ඇතිවන කේෂ්ත්‍ර හඳුනාගැනීමට අවදානම් ඇගයීම් ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් අනුමගනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. | අවදානම් ඇගයීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ කසළ කළමනාකරණ ව්‍යාපෘතියේ කොම්පෝස්ට් ව්‍යාපෘතියට අමතර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.76,512,353 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. මේ සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ 2018 ජනවාරි 29 දින ගිවිසුමකට | නියමිත පරිදි අදාල ඉදිකිරීම් නිමකර අපේක්ෂිත අරමුණු ඉටු කර ගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

එළඹ තිබුණු අතර දින 180 ක් ඇතුළත මෙම ඉදිකිරීම නිම කළ යුතුවිය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානයේදී ද අදාල කාර්යයන් අවසන් වී නොතිබුණි.

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය**<br>**---------------------------**<br>ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 33,536,000 ක් වූ ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ක්‍රියාත්මක ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 ජුනි 29 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. එහෙත් 2020 මැයි වන විටත් ව්‍යාපෘතියේ සැලසුම් අදියරේ කටයුතු පමණක් අවසන් කර තිබුණි. මේ නිසා ව්‍යාපෘති කාලසීමාව 2021 දක්වා දීර්ඝ කර තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 6 ½ ක් ගත වී ඇතත්, බිම් පිරවුම් 04 හි ඉදිකිරීමේ කටයුතු මේ දක්වාම ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ඊට අදාළ කාර්යසාධනයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

| | | |
|---|---|---|
| **(ආ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය**<br>**--------------------------**<br>සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 89 ක් පමණ වන අතර 2020 ඔක්තෝබර් වන විට එය සියයට සීයක ප්‍රගතියක් අත්කර ගැනීමට සැලසුම් කර තිබුණි. 2020 මාර්තු වන විට ව්‍යාපෘතිය විසින් ඉල්ලා තිබූ මුදල රු.මිලියන 970 ක් වුවද ලැබී තිබූ මුදල් වල එකතුව රු.මිලියන 368 ක් විය. ඒ හේතුවෙන් සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඇති බැදීම් අවසන් කිරීමට නොහැකි වී තිබුණි. කොන්ත්‍රාත් වැඩ මේ වන විට ඉතා මන්දගාමී අයුරින් පැවතුණ අතර ලබාගත හැකි ප්‍රතිලාභද ප්‍රමාද වී තිබුණි. | -එම- | -එම- |
| **(ඇ) පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය ව්‍යාපෘතිය**<br>**---------------------------**<br>මෙම ව්‍යාපෘතිය සඳහා පිළියෙල කළ මූල්‍ය කළමනාකරණ මෘදුකාංග පද්ධතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිරිපත් කළ යුතු භෞතික කාර්යසාධන දත්තයන් මේවන තෙක් පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | භෞතික කාර්යසාධන දත්තයන් ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතුය. තවද ව්‍යාපෘති කටයුතු නිම වීමට ඉතිරිව ඇති කාලය වර්ෂයක් පමණ කෙටි කාලයක් බැවින් භෞතික කාර්යසාධනය සියයට සියයක් දක්වා වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. | -එම- |

## 3.4 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය සඳහා රජයේ ප්‍රම්පාදන මාර්ගෝපදේශය අනුව සැපයීම් හා සේවා ලබා ගැනීමට රු.4,300,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.773,062 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.3,526,938 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 82 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අදාල මාර්ගෝපදේශ අනුව කටයුතු කරන බව දක්වා ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය විසින් අමාත්‍යාංශය සඳහා වූ නව ගොඩනැගිල්ල ඉදිකිරීම් නිමකර වර්ෂ 03 කට ආසන්න කාලයක් ඉක්ම ගොස් තිබුණි. එහෙත් වගකීම් කාලය තුළ සිදුකළ යුතු අලුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් රැඳවුම් මුදල් වන රු.30,737,540 ක මුදල නිදහස් කිරීමට හෝ අවසන් බිල්පත් ගෙවා නිම කිරීමට හෝ නොහැකි වී තිබුණි. | අළුත්වැඩියාවන් නිසි පරිදි සිදුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර එය ප්‍රතිපත්තිවලට පමණක් සීමා වී තිබුණි. | නිවැරදිව ප්‍රතිපත්ති සකස් කර නිසිපරිදි අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය. | ප්‍රතිපත්ති සකස් කිරීම මේ වන විට ආරම්භ කර ඇති අතර රාජ්‍ය ගිණුම් කාරක සභාවෙන් ද විමසීම් කර තිබුණි. එමෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇති අතර එම ප්‍රතිපත්තියේ කොටසක් ලෙස විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය කළමනාකරණය ද ඇතුළත් බව දන්වා සිටිමි. |
| (ආ) | රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය හා අන්තරායකාරී අපද්‍රව්‍ය පරිසරයට මුසුවීම තුළින් සිදුවන පරිසර හානිය වර්තමානයේ මෙන්ම අනාගතයේදී ද ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයන් කෙරෙහි අහිතකර බලපෑම්වලට ලක්විය හැකි වුවද ඒ සඳහා අවධානය යොමු කිරීම අවම මට්ටමක තිබුණි. | රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය හා අන්තරායකාරී අපද්‍රව්‍ය පරිසරයට මුසුවීම තුළින් සිදුවන පරිසර හානිය වලක්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | සායනික අපද්‍රව්‍ය විධිමත් ක්‍රමවේදයක් මගින් බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ණ අධීක්ෂණය යටතේ සිසිලි හනාරෝ පුද්ගලික ආයතනය විසින් මෙට්‍රික් ටොන් 08 – 10 ක පමණ සායනික අපද්‍රව්‍ය පිලිස්සිය හැකි ඉන්සිනරේටර් යන්ත්‍රයක් මුතුරාජවෙල සවිකර ඇත. 2019 අප්‍රේල් 23 වන දින දී එහි කටයුතු ආරම්භ කිරීමට නියමිතව තිබූ නමුත් පසුගිය දිනවල රටතුළ පැවති අයහපත් වාතාවරණය නිසා සේවක මහතුන්ගේ නොපැමිණීම මත එම කාර්යය නියමිත දින ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පරිපාලන සේවයේ හා ඉංජිනේරු සේවයේ තනතුරු 36 ක් පුරප්පාඩුව පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හෝ අවශ්‍ය පරිදි එය සංශෝධනය කර ගැනීමට ක්‍රියාමාර්ග කාලීනව ගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | තෘතීයික, ද්විතික හා ප්‍රාථමික මට්ටම්වල දෛනික කාර්යන් සඳහා සෘජුව බලපාන තනතුරුවල සේවක පුරප්පාඩු 139 ක් පැවතුණි. | -එම- | -එම- |